# හබරණ ටැම්පිට විහාරයේ සිතුවම් විනාශවීමට බලපා ඇති හායනකාරක

ජී.සී.සී. පෙරේරා[1], ඒ.ජී.එස්.එච්. කරුණාරත්න[2], කේ.ඒ.ඩී.එස්.එල්. නානායක්කාර[3]

ශ්‍රී ලංකාවේ ටැම්පිට විහාර 204 ක් පමණ පවතින බව මේ වනවිට හඳුනාගෙන ඇති අතර ඉන් ස්ථාන 85 ක ඇති විහාර ප්‍රමුඛතාවය අනුව සංරක්ෂණ කටයුතු පුරාවිද්‍යා දෙපාර්තුමේන්තුව විසින් සිදුකරනු ලැබේ. උතුරුමැද පළාතේ පවතින ටැම්පිට විහාර හා සසඳන විට යහපත් මට්ටමේ පවතින විහාරයක් ලෙස හබරණ පුරාණ ටැම්පිට විහාරය පෙන්වාදිය හැකිය. මහනුවර යුගයට අයත් සිතුවම් විහාරයේ ඇතුලත් අතර අද වන විට විනාශ වෙමින් පවතී. හබරණ ටැම්පිට විහාරයේ සිතුවම් කෙරෙහි බලපා ඇති හායනකාරක තත්ත්වය වර්තමානයේ එම සිතුවම් විනාශවීමට කෙසේ බලපායි ද යන ගැටළුව ඔස්සේ මෙම ටැම්පිට විහාරයෙහි සිතුවම්වල හායනකාරක හඳුනාගැනීම, ඒ පිළිබඳ අවබෝධයක් ලබාගැනීම හා එහි වර්තමාන තත්ත්වය පිළිබඳ සොයා බැලීම සිදුකරන ලදී. මේ සිතුවම් ඇති බදාම පෘෂ්ඨය නිර්මාණය කර ගැනීමේදී වැලි, මැටි, දහයියා මිශ්‍ර බදාමයක් යොදාගෙන තිබේ. ඒ මතුපිට හුණු ආලේප කර සිතුවම් නිර්මාණය කර ඇත. වර්තමානයේ දී මෙම ස්ථානයේ සිතුවම් තලයෙහි බදාම කොටස් කඩා වැටීමත් වර්ණ දුර්වල වීමත් දිලීර හට ගැනීමත් ප්‍රධාන වශයෙන් හඳුනාගත හැකි වේ. උෂ්ණත්වය ආර්ද්‍රතාවය හේතුවෙන් බිත්ති ඉරි තැලීම, පිපිරීම, බදාම පතුරු ගැලවීම හා බොල් වීම, ආදිය ද දක්නට ලැබේ. වැසි ජලය හේතුවෙන් සිතුවම් විනාශයට පත්වීම ද දැවයෙන් කළ සිවිලිම දිරාපත්වීම ද සිදුවී තිබේ. බිත්ති මත වේයන් විසින් හුඹස් බැද තිබීමත් විවිධ කෘමි සතුන් සිතුවම් පෘෂ්ඨය සිදුරු කර ඇති ආකාරය අධ්‍යයනයේ දී දක්නට ලැබුණු තවත් එක් සාධකයකි. විහාරය තුළට විදුලි ආලෝකය ලබාගැනීම උදෙසා සිදුකළ ක්‍රියාදාමයේ දී කඩතොළු වැසීම සඳහා සිමෙන්ති භාවිත කර තිබීම නිසා සිමෙන්තිවල ඇති ජිප්සම් ක්‍රියාකාරීත්වය නිසා වර්තමානය වන විට සිතුවම් විනාශ වෙමින් පවතී. පහන් දැල්වීම හා සුවඳ දුම් දැල්වීම ද මේ සඳහා බලපා තිබේ. ඒ අනුව දේශගුණික සාධක, සත්ත්ව හානි, මානව ක්‍රියාකාරකම් යනාදිය මූලික වශයෙන් මෙම විහාරයේ දක්නට ලැබෙන හායනකාරක වන අතර බලධාරීන්ගේ නිසි අවධානය යොමු නොවීම හා විධිමත් සංරක්ෂණ ක්‍රියාවලියකට යොමු නොකිරීම වර්තමානයේ දී දක්නට ලැබෙන තත්ත්වය ලෙස පෙන්වාදිය හැකි වේ.

**ප්‍රමුඛ පද :** ටැම්පිට විහාරය, සිතුවම්, හබරණ, හායනකාරක, සංරක්ෂණය

---

[123] පුරාවිද්‍යා හා උරුම කළමනාකරණය අධ්‍යයනාංශය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය gc.chathurani@gmail.com